00165

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2021/2022**

ගිවිසුම් නීතිය - **LLU4805**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - **2023.01.10** වේලාව - ප.ව.01.30 - ප.ව. 04.30

---

මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.

පළමු කොටසින් ප්‍රශ්න එකක් (01) පමණක් සහ දෙවන කොටසින් ප්‍රශ්න හතරක් (04) බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

## I වන කොටස - නියෝජ්‍යත්ව නීතිය

එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. වර්ෂ 2022 හි ජනවාරි මස, රමේෂ් විසින් නිමල් ව තම නියෝජිතයා ලෙස පත්කර කොළඹ 07 හි පිහිටි සිය බද්ධ නිවාසය විකුණන ලෙස උපදෙස් දුන්නේ ය. රමේෂ්හට විදේශගත වීමට අවශ්‍ය වී තිබූ බැවින් නියෝජ්‍යත්ව ගිවිසුමට අනුව බද්ධ නිවාසය මාස හයක (06) කාලයක් තුළ රුපියල් මිලියන තුනක මුදලකට විකිණිය යුතු වේ. ලබා දී ඇති කාලසීමාව තුළ ගැණුම්කරුවෙකු සොයාගත හොත් නිමල්හට රුපියල් 250,000 ක වේතනයක් ලබාදීමට ද පොරොන්දු වී තිබුණි. නිමල් මෙම විකිණීමට ඇති ගොඩනැගිල්ල පිළිබඳව විවිධ පුවත්පත්වල සහ වෙබ් අඩවිවල දැන්වීම් පළකර, වෙළඳ දැන්වීම සඳහා ගිය වියදම මෙන් දෙගුණයක් මුදල් රමේෂ්ගෙන් අයකර ගත්තේ ය. සැබෑ ලෙසම වෙළඳ දැන්වීම සඳහා වන මුදල බවට වූ හැඟීම මත රමේෂ් නිමල් ඉල්ලා සිටින මුදල ඔහුට ගෙව්වේ ය. මැයි මාසය වනවිට, චමලි විසින් රුපියල් මිලියන 2.5 ක මුදලකට බද්ධ නිවාසය මිල දී ගැනීමට එකඟ වූ අතර මෙම ගනුදෙනුව සාර්ථක වුවහොත් නිමල්ට රුපියල් 150,000 ක් ලබා දෙන බවද පවසා සිටියේ ය. කෙසේ හෝ බද්ධ නිවාසය රුපියල් මිලියන 2.5 කට විකිණීමට නිමල් විසින් රමේෂ් ව එකඟ කර ගත්තේ ය. එකඟ වූ පරිදි, චමලි නිමල් හට කොමිස් මුදල ගෙව්වා ය. පසුව නිමල් පිළිබඳ සත්‍ය දැනගත් රමේෂ් ඔහුගේ වේතන දීමනාව ගෙවීම ප්‍රතික්ෂේප කළේ ය.

රමේෂ් මෙම ගැටළුව සම්බන්ධයෙන් ඔබගේ උපදෙස් පතයි.

අදාල නඩු තීන්දු උපුටා දක්වමින් රමේෂ්ට උපදෙස් ලබා දෙන්න. (ලකුණු 20)

02. පහත ප්‍රකාශයන්හි වලංගුභාවය සාකච්ඡා කරන්න.

(අ) නියෝජ්‍යත්ව නීතිය ප්‍රධානියා මත යම් වගකීම් උද්ගත කරයි.

(ආ) අත්‍යවශ්‍යතාව (necessity) මත නියෝජ්‍යත්වයක් නිර්මාණය වීම සඳහා සමහර කොන්දේසි සම්පූර්ණ විය යුතු ය.

(සෑම කොටසකටම ලකුණු 10 බැගින් හිමි වේ.)

(ලකුණු 10 x 02 = 20)

## II වන කොටස - ගිවිසුම් නීතිය

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

03. පුංචි මැණිකේ සහ සුමනපාල විසින් අඹගහවත්ත නැමති ඉඩම ජීවිත භුක්තිය තබාගනිමින් සකසනු ලැබූ ත්‍යාග ඔප්පුවක් මගින් ඔවුන්ගේ බෑනා වන යසාර සමත්‍යාග ලැබුම්කරු ලෙස ඇතුලත් කරමින් එකම දියණිය වන රසංගිහට තෑගි කළේය. ඔවුන් සියලු දෙනා අඹගහවත්ත ඉඩමේ එකට ජීවත් විය. ඔවුන්ගේ විවාහය පවත්වාගෙන යන විට රසංගිට සහ යසාරට දැනුනේ රසංගිගේ දෙමාපියන් බරක් ලෙසයි. පසුකාලීන ව, රසංගි තම දෙමාපියන්ගේ වෛද්‍ය වියදම් දැරීම ද ප්‍රතික්ෂේප කළා ය. රසංගි පුංචි මැණිකේ හට නිවසේ වැඩකටයුතු කිරීම තහනම් කල අතර සුමනපාල හට සියලු පිරිසිදු කිරීමේ කටයුතු සහ ගෙවතු වගා කටයුතු කරන ලෙස පැවසුවා ය. තවදුරටත්, බීමත්ව පැමිණෙන යසාර විසින් කිහිපවතාවක් ම සුමනපාල හට දරුණු ලෙස පහර දෙනු ලැබී ය. පුංචි මැණිකේ සහ සුමනපාල තම දියණියට දුන් ත්‍යාග අවලංගු කිරීමට අදහස් කර ඇති අතර, ඔබගේ උපදෙස් පතයි.

ජීවතුන් අතර සිටිය දී දෙන ත්‍යාග (*Donation inter vivos.*) සම්බන්ධ නීතිය අදාළ කර ගනිමින් පුංචි මැණිකේට සහ සුමනපාලට උපදෙස් දෙන්න.

ඔබගේ තර්කය තහවුරු කිරීමට අදාල නඩු තීන්දු සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන පවතී නම් ඒවා උපුටා දක්වන්න. (ලකුණු 20)

04. මහේෂා කොළඹ ප්‍රදේශයේ පිහිටි රූපලාවණ්‍යාගාරයක හිමිකාරියක් වන අතර රූපලාවණ්‍ය ද්‍රව්‍ය මිළ දී ගැනීම සහ විකිණීම ද සිදු කරයි. නීති විරෝධී ගිවිසුම්වලට එළඹීම සම්බන්ධයෙන් ඇයට චෝදනා නගා ඇත. පහත දැක්වෙන ගිවිසුම් නීති විරෝධී ද නැද්ද යන්න සහ ඒවායේ විය හැකි ප්‍රතිවිපාක පිළිබඳව මහේෂා ඔබගෙන් උපදෙස් පතයි.

අදාල නඩු තීන්දු උපුටා දක්වමින් එක් එක් ගිවිසුම පිළිබඳ ව මහේෂාට උපදෙස් දෙන්න.

අ. මහේෂාගේ කලින් සේවකයෙකු වූ ගංහා, මහේෂාගේ රූපලාවණ්‍යාගාරයේ සේවාකාලය සම්පූර්ණ කල වහා ම ගාල්ලේ තමාගේ ම රූපලාවණ්‍යාගාරයක් ආරම්භ කලා ය. මහේෂා සමඟ ගංහා ඇතිකර ගත් සේවා ගිවිසුමෙහි අන්තර්ගත වගන්තියක සඳහන් වූයේ;

"සේවා කාලය සම්පූර්ණ කල පසු ඔබ කිසිදු තරඟකාරී ආයතනයක සේවය නොකලයුතු ය සහ වසර 12 ක් යන තෙක් ශ්‍රී ලංකාව තුළ කුමන හෝ තැනක ඔබගේ රූපලාවණ්‍යාගාරයක් ආරම්භ නොකල යුතු ය." (ලකුණු 08)

ආ. මහේෂා රුපියල් දස ලක්ෂයක වටිනාකමින් යුතු රූපලාවණ්‍ය ද්‍රව්‍ය විදේශ රටකින් ආනයනය කලා ය. කෙසේනමුත්, ඒ වන විට රටතුල බලාත්මකව පැවති සංවරණ සීමා හේතුවෙන් ඇයට එම රූපලාවණ්‍ය ද්‍රව්‍ය රේගුවෙන් නිදහස් කර ගැනීමට නොහැකි විය. සංවරණ සීමා ලිහිල් කිරීමෙන් පසුව මහේෂා රේගුවෙන් තම ආනයනික රූපලාවණ්‍ය ද්‍රව්‍ය නිදහස් කර ගැනීමට උත්සහ කළා ය. කෙසේවුවද, රේගු නිලධාරීන් රූපලාවණ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම දින දෙකකට පෙර තහනම් කල බව ඇයට දැනුම් දී, ඇයගේ රූපලාවණ්‍ය ද්‍රව්‍ය අත් අඩංගුවට ගත්තේ ය. (ලකුණු 06)

ඇ. මහේෂා තම ව්‍යාපාරය ආරම්භ කල අවස්ථාවේ රූපලාවණ්‍ය ද්‍රව්‍ය විකිණීම සඳහා බලපත්‍රයක් ලබා ගත්තා ය. මෙම බලපත්‍රය මාස හයකට (06) ඉහත දී කල් ඉකුත් විය. කෙසේ වුවද, ඒ පිළිබඳ දැනීමකින් තොරව මහේෂා ව්‍යාපාර කටයුතු නොනවත්වා ඉදිරියට කරගෙන ගියා ය. නිමාලි රුපියල් 65,000 ක් වටිනා රූපලාවණ්‍ය ද්‍රව්‍ය මහේෂාගෙන් ණයට ගත්තා ය. පසුව, භාණ්ඩ විකුණන අවස්ථාවේ දී මහේෂාට කල් ඉකුත් වූ බලපත්‍රයක් පැවති බව දැනගත් නිමාලි, මහේෂාට ගෙවීම ප්‍රතික්ෂේප කලා ය.

(ලකුණු 06)

(ලකුණු 8+6+6 = 20)

05. යසස් වසර අවසාන නිවාඩුව නුවරඑළියේ සංචාරය කිරීම සඳහා **tripNstay (Pvt) Ltd.** ආයතනයේ නිවාඩු නිකේතනයක් අන්තර්ජාලය හරහා වෙන්කර ගත්තේ ය. අන්තර්ජාලය හරහා සිදුකරන වෙන්කර ගැනීමේ ක්‍රියාවලියේ දී, ඔහුගෙන් ඉල්ලා සිටියේ ගිවිසුමේ අඩංගු සියලුම නියමයන් සහ කොන්දේසි කියවා තේරුම්ගෙන තහවුරු කරන ලෙසයි. වෙන් කරවා ගැනීමේ වෙබ් පිටුව තුළ ඔහුට සියලු නියමයන් සහ කොන්දේසි බාගත කරගත හැකි අධි සබැඳියාව **(hyperlink)** පැවතුණි. යසස් නියමයන් හා කොන්දේසි කියවීමට හෝ බාගත කිරීමට වෙහෙස නොවූ අතර තහවුරු කිරීමේ විධානය ක්‍රියාත්මක කළේය. ඔහු නුවරඑළියට ලඟා වූ විට, නිවාඩු නිකේතනයේ ගේට්ටුවේ දී පහත වගන්ති ඇතුලත් ලේඛනයක් අත්සන් කරන ලෙස ඉල්ලා සිටියේ ය.

අ. කුලීකරු අන්තර්ජාලය මගින් නිවාඩු නිකේතනය වෙන්කරවා ගැනීමේ දී ගිවිසුමෙහි ඇතුළත් සියලු නියමයන් සහ කොන්දේසි කියවා තේරුම්ගෙන පිළිගන්නා බව තහවුරු කරයි.

ආ. නිවාඩු නිකේතනයේ උපකරණවල දෝෂයක් හේතුවෙන් කුලීකරුට සිදුවන ඕනෑම හානියක් හෝ අනතුරක් සඳහා **tripNstay (Pvt) Ltd.** ආයතනය වගකීමට බැඳෙන්නේ නැත.

මීට පෙර නිවාඩු නිකේතනයේ රැඳී සිටි රීමා ගෑස් රෙගියුලේටරය දෝෂ සහගත ලෙස සවිකිරීම හේතුවෙන් මුළුතැන්ගෙය ලෙස භාවිත කල නිවාඩු නිකේතනයේ පිටුපස කාමරයේ ගෑස් කාන්දුවක් පැවතුණි. මේ පිළිබඳ නොදත් යසස් ඔහු රැඳී සිටි පළමු රාත්‍රියේ දී ප්‍රධාන විදුලි ස්විච්චය ක්‍රියාත්මක කිරීම සඳහා පසුපස කාමරයට ගියේ ය. යසස් විදුලි ස්විච්චය ක්‍රියාත්මක කිරීමේ දී ගෑස් පිපිරී ගිය අතර ඔහුට බරපතල තුවාල සිදුවිය. යසස් **tripNstay (Pvt) Ltd.** ආයතනයෙන් වන්දි ලබා ගැනීමට අදහස් කරයි.

යසස් ඔහුගේ නීතිඥවරයා ලෙස ඔබේ සේවය ලබා ගනී. යසස්ට උපදෙස් දෙන්න.

(ඉලෙක්ට්‍රොනික ගිවිසුම් සම්බන්ධ නීති ඔබේ පිළිතුර තුළ සාකච්ඡා කිරීම අවශ්‍ය නොවේ.)

(ලකුණු 20)

06. මිල්හාන් කටාර් හි සැලසුම් ශිල්පියෙකු **(draftsman)** ලෙස වසර දෙකක සේවා ගිවිසුම අවසන් කිරීමෙන් අනතුරු ව මෑතක දී ශ්‍රී ලංකාවට පැමිණියේ ය. මිල්හාන් තමාගේ ඉතුරු කරගත් සියලු මුදල් භාවිතා කර ඔහුගේම ව්‍යාපාරයක් ශ්‍රී ලංකාව තුල ආරම්භ කිරීමට අදහස් කරයි. ආරුගම්බෙ වෙරළ අසල කුඩා වෙළඳ සැලක් ඇති නෙත්මි එය රුපියල් 175,000 ක වාර්ෂික ගෙවීමක් යටතේ මිල්හාන් ට කුලියට දීමට එකඟ වූවා ය. මිල්හාන් ලී කැටයම් සඳහා උනන්දුවක් දැක් වූ අතර විදේශිකයන් ඉලක්ක කර මින් මෙම කුලියට ගත් ස්ථානය සිහිවටන වෙළඳසැලක් විවෘත කිරීමට සැලසුම් කළේය. මෙම වෙළඳසැල මීට පෙර ආහාර වෙළෙන්දෙකුට කුලියට දී තිබුණු අතර නෙත්මි මිල්හාන්ට වෙළඳසැල කුලියට දීමට එකඟ වන අවස්ථාවේ දී ප්‍රදේශයේ ව්‍යාපාර අඩුවීම නිසා වෙළඳ සැලෙන් ඉවත් වෙමින් සිටියේ ය. නිවාඩු සමයේ දී වෙළඳසැල සූදානම් වනු ඇතැයි තහවුරු කර ගැනීම අපේක්ෂාවෙන් යුක්තව නෙත්මි සමග ඇතිකර ගත් ගිවිසුමෙහි කොන්දේසියක් ඇතුලත් කරමින් මිල්හාන් සඳහන් කලේ දෙසැම්බර් 01 වනදා වන විට ඔහුට වෙළඳ සැලට පිවිසිය හැකි බවයි. ඒ අතරතුර දී, වෙළඳසැලේ විකිණීම සඳහා ලී කැටයම් තොගයක් මිලට ගැනීමට ඔහු තම ඉතුරුම්වලින් රුපියල් 80,000 ක් පමණ ආයෝජනය කලේ ය.

දැනුවත්භාවයෙන් තොරව, මිල්හාන් සහ නෙත්මි විසින් පහත සඳහන් වගන්තිය ගිවිසුම සකස් කරන විට ඇතුළත් කරන ලදී.

" දෙසැම්බර් පළමු වන දිනයේදී වෙළඳසැලේ භුක්තිය මිල්හාන් හට බාර නොදුන්නහොත් ඇති වන්නා වූ ඕනෑම හේතුවක් මත නෙත්මි විසින් ගිවිසුම් කඩ කර ඇති අවස්ථාවක දී මෙම ගිවිසුම අවසාන වූ බවට සැලකිය යුතු අතර අලාභ සම්බන්ධයෙන් එකඟ වූ පරිදි නෙත්මි විසින් මිල්හාන් හට රුපියල් 85,000 ක් හෝ ඔහු මිල දී ගත් භාණ්ඩ විකිණීමෙන් හෝ නැවත භාරදීමෙන් මිල්හාන් යථාවත් කර ගන්නා ඕනෑම මුදලල් ගෙවීමට එකඟ වී ඇත."

කෙසේ වුවද , නෙත්මි දෙසැම්බර් 01 වන දින වන විට එකඟ වූ පරිදි මිල්හාන් හට දේපල බාරදීමට අපොහොසත් වූවා ය.

උක්ත වගන්තිය ගිවිසුම් නීතිය යටතේ බලාත්මක වන්නේ ද යන්න පිළිබඳ ව අදාල අධිකාරීන් වෙත අවධානය යොමු කරමින් නෙත්මිට උපදෙස් දෙන්න. (ලකුණු 20)

07. "යම් ප්‍රකාශයක් සිදු කරන අවස්ථාවේ සත්‍ය වුවද සාකච්ඡා අතරතුර කාලයේ දී අසත්‍ය බවට පත් වන්නේ නම් එම ප්‍රකාශය අසත්‍ය වූ බවට දැන සිටින පුද්ගලයා එම සිද්ධිමය වෙනස්වීම අන් අයට අනාවරණය කිරීමේ වගකීමට යටත් වේ."

**With v O'Flanagan (1936)Ch 575**

ගිවිසුම් නීතිය යටතේ එන අවනිදේශනය පිළිබඳ අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශය අගයන්න.

ඔබේ පිළිතුර අදාල නඩු තීරණ මගින් තහවුරු කරන්න. (ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) 'එලෙසම ඉටුකිරීම' පිළිබඳ සහනය

(ආ) ආර්ථික උත්තර්ජනය

(ඇ) රෝම ලන්දේසි නීතිය යටතේ සාධාරණ හේතුව

(සෑම කොටසකටම ලකුණු 10 බැගින් හිමිවේ.)

(ලකුණු 10 x 02 = 20)

හිමිකම් ඇවිරිණි.